**රජයේ නිවේදන**

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින් එම වගන්තිය යටතේ පනවන ලද 2016.11.10 වැනි දිනැති අංක 1992/29 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද උපලේඛනය (II) හි සඳහන් අයිතම අංක 1 (ඇ) පහත උපලේඛනය පරිදි සංශෝධනය කරමි.

මෙම නියෝගය 2017.06.10 දින සිට ක්‍රියාත්මක වේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017.06.07 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| විස්තරය | | නිෂ්පාදන බද්ද |
|---|---|---|
| රජයේ නිලධාරියකු විසින් 2016.07.14 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හෝ එයට කරන ලද කරන ලද සංශෝධන වලට අනුකූලව නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථයක් හෝ ආනයනය කරනු ලබන මෝටර් රථයක මිල, රක්ෂණය සහ ගැල් කුලිය ඇතුළත් වටිනාකම (CIF value) | | |
| (i) | ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 25,000/- ට නොවැඩි | ගෙවිය යුතු බද්ද ප්‍රමාණයෙන් 35% |
| (ii) | ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 25,000/- ට වැඩි නමුත් ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 30,000/- ට නොවැඩි | ගෙවිය යුතු බද්ද ප්‍රමාණයෙන් 40% |